
# කාර්ය සාධන වාර්තාව



## 2023

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

2023 වසර ශ්‍රී ලංකාවේ රබර් ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් සටහන් කළ වසරක් ලෙස හඳුන්වා දිය හැකි ය. ආරම්භයේ පටන් රබර් වගාව සඳහා විවිධාකාරයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර, ඒ සඳහා අරමුදලක් ද ක්‍රියාත්මක විය. රබර් වගාව සඳහා එතෙක් පැවති සහනාධාර වැඩසටහන වෙනස් කරමින්, 2023 වසරේ සිට වගාකරුවන්ට අවශ්‍ය තත්ත්වයෙන් උසස් බද්ධ රබර් පැළ සහනාධාර ලෙස නොමිලේ ලබා දීම ආරම්භ කරන ලදි. ඒ අනුව, කුඩා වතු හිමියන් සඳහා නව වගා හා නැවත වගා වැඩසටහන් යටතේ හෙක්.742 ක් වගා කිරීමට දෙපාර්තමේන්තුව මඟින් බද්ධ රබර් පැළ 597,655 ක් නොමිලේ ලබා දීම සිදු කර ඇත.

දීර්ඝ කාලයක සිට පැවති රබර් ඉඩම් ප්‍රමාණය නිශ්චය කරගැනීමේ ගැටළුවට විසඳුමක් ලෙස, රබර් ඉඩම් සංගණනයක් 2023 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, එය 2024 වර්ෂය තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. එයින්, රබර් ක්ෂේත්‍රයට අදාළව වඩාත් නිවැරදි තොරතුරු පද්ධතියක් ස්ථාපනය කරගැනීමට හැකියාව ලැබෙනු ඇත.

වසර පුරා පැවති අධික වර්ෂාවත්, පත්‍ර පතන රෝග ව්‍යාප්තියත්, රබර් සඳහා ඉහළ ස්ථාවර මිලක් නොලැබීමත් යන කරුණු හේතුවෙන් වාර්ෂික නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව පහළ ගිය අතර රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් රට තුළ පරිභෝජනය කළ ස්වභාවික රබර් ප්‍රමාණය ද, පෙර වසරට සාපේක්ෂව අඩු වී ඇත. එසේ වුවද, රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය මඟින් 2023 වසර තුළ ඇ.ඩො.මිලියන 930 ක ආදායමක් ඉපයීමට රබර් ක්ෂේත්‍රයට හැකිවීම සතුටට කරුණකි.

**සී.සී.මුහන්දිරම්ගේ**
**අධ්‍යක්ෂ ජනරාල්**
**රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**

# පටුන


*දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු* 1

**1. හැඳින්වීම** **02-07**

1.1. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2
1.2. රබර් වගාව 2
1.3. රබර් කර්මාන්තය 2
1.4. ආයතනයේ ප්‍රධාන කාර්යයන් 3
1.4.1.ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් 3
1.4.2.ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන් 3
1.4.3.රබර් පැළ තවාන්වල කාර්යයන් 3
1.5. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 4
1.6. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය 5
1.7. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු 6-7

**2. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය** **08-29**

2.1. රබර් නැවත වගාව 08
2.1.1.රබර් නැවත වගාව - කුඩාවතු අංශය 08
2.1.2.රබර් නැවත වගාව - වැවිලි අංශය 10
2.2. රබර් නව වගාව 10
2.2.1.රබර් නව වගාව - කුඩා වතු අංශය 10
2.3. රබර් පැළ නිෂ්පාදනය 12
2.3.1.රජයේ පැළ තවාන් 12
2.3.2.පැළ නිෂ්පාදනය (පෞද්ගලික පැළ තවාන්) 13
2.4. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන 14
2.5. අතුරු බෝග වගාව 15
2.6. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම 17
2.6.1.කිරි කැපුම් ශිල්පී පුහුණුව (සාමාන්‍ය) 17
2.6.2.බද්ධකරුවන් පුහුණුව 17
2.6.3.කෑගල්ල ප්‍රාදේශිය කාර්යාලය මඟින් කළ පුහුණු වැඩසටහන 18
2.7. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු- 2023 19
2.7.1.රබර් වගා බිම් ප්‍රමාණය 19
2.7.2.ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් නිෂ්පාදනය -2023 19
2.7.3.රබර් නිෂ්පාදන වියදම 20
2.7.4.ස්වාභාවික රබර් අපනයනය 20
2.7.5.ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය 21
2.7.6.ස්වභාවික රබර් ආනයනය 22
2.7.7.මුළු රබර් ආනයනය 23
2.7.8.රබර් මිල 24
2.7.8.1. රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබා ගත් මිලෙහි මාසික සාමාන්‍යය 24

2.7.9.අන්තර් ජාතික රබර් මිල 26
2.8. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු 26
2.9. ඒකාබද්ධ අරමුදල 27
2.10. සෙස් බදු අය කිරීම. 28

**3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 30-41**

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 30
3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 31
3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය 31
3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 32
3.5. විගණකාධිපති වාර්තාව 33
3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 39
3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 40

**4. කාර්ය සාධන දර්ශක 42**

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව) 42

**5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 43**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 43
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 43

**6. මානව සම්පත් පැතිකඩ 44-46**

6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය 44
6.2. මානව සම්පත් සංවර්ධනය 44
6.3. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2023.12.31 දිනට 45
6.4. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය 45
6.5. 2023 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය 46

**7. අනුකූලතා වාර්තාව 47-52**

## දැක්ම

**ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.**

## මෙහෙවර

*නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම*

## ආයතනයේ අරමුණු

- පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම තුළින් දේශීය රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම.
- රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම තුළින් රබර් සඳහා වැඩි මිලක් ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.
- ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- දේශීය දැව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා දායක වීම.
- ස්වභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසාරභාවය තහවුරු කිරීම.

# 1. හැඳින්වීම

## 1.1.රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ රබර් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ප්‍රධානතම ආයතනයක් ලෙස රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හඳුනාගත හැකි ය. 1934 වර්ෂයේ පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේදී රබර් පාලන දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වනු ලැබ ඇති අතර 1994 වසරේ සිට එය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වනු ලබයි.

දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ව්‍යාප්ති සේවා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා රබර් වගාව ව්‍යාප්තව පවතින ප්‍රදේශ ආවරණය කරමින් කෑගල්ල, කළුතර, රත්නපුර, ගාල්ල සහ මොනරාගල යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 5ක් දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇත. එසේම තත්ත්වයෙන් උසස් ගුණාත්මක රබර් පැළ ගොවීන් වෙත ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව යටතේ වැලිකඩමුල්ල, මීරිගම, ඇගල්ඔය, ගුරුගොඩ, කරපිංච, පදියතලාව, කුඹුක්කන සහ මිද්දෙණිය යන ප්‍රදේශවල පැළ තවාන් ස්ථාපනය කර ඇත.

## 1.2. රබර් වගාව

තෙත් කලාපය තුළ වගාව සඳහා භූමිය සීමා වීම හේතුවෙන් වර්තමානය වන විට රබර් වගාව සාම්ප්‍රදායික නොවන අතරමැදි හා වියළි කලාප දක්වා හඳුන්වා දීම සිදු කර ඇත. එමඟින් රබර් වගාව සඳහා වන ශ්‍රමිකයන්ගේ හිඟය මෙන්ම වැසි සහිත කාළගුණය නිසා කිරි අස්වැන්න ලබා ගැනීමට හැකි දින ගණන සීමා වීම, රෝග පැතිරීම යන ගැටළුවලට ද සාධනීය විසඳුම් ලැබී ඇත.

සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල වැවිලි බෝගයක් ලෙස රබර් වගාව සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. එය රබර් වගාව සඳහා සාධනීය තත්ත්වයකි.

## 1.3. රබර් කර්මාන්තය

ඉංග්‍රීසි පාලන සමය තුළ මෙරටට හඳුන්වා දුන් රබර් වගාව ආරම්භයේදී අපනයනය අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක විය. වර්තමානය වන විට වසරකට ඩොලර් බිලියන 01කට ආසන්න අපනයන ආදායමක් රබර් අංශය මඟින් උපයනු ලබයි.

ආරම්භයේදී රබර් අමු රබර් ලෙස අපනයනය වැඩි වශයෙන් සිදු කර ඇත. පසු කාලීනව ආයෝජන ප්‍රවර්ධන කලාප ආරම්භයත් සමඟ රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම දේශිය වශයෙන් වැඩි වීමක් සිදු විය. ඒ අනුව, රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ අපනයනය වැඩි වීමක් සිදු වූ අතර, එය අපනයන ආදායම වැඩිවීමට ද හේතු විය.

## 1.4. ආයතනයේ ප්‍රධාන කාර්යයන්

### 1.4.1. ප්‍රධාන කාර්යාලයේ කාර්යයන්

- ප්‍රධාන පනත් හා නෛතික මූලාශ්‍ර මඟින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- නැවත වගා සහ නව වගා සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය කාර්යාල මඟින් සහනාධාර ලබා දීම හා අධීක්ෂණය කිරීම.
- රජයේ තවාන් මඟින් උසස් වර්ගයේ බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම හා ලබා දීම.
- රබර් වගාව හා වෙළඳාම සඳහා බලපත්‍ර ලබා දීම.
- රබර් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය, දේශීය පරිභෝජනය, අපනයනය හා ආනයනය පිළිබඳ දත්ත හා තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගැනීම.
- රබර් වෙළඳපල පිළිබඳව කුඩා රබර් වතු හිමියන් දැනුවත් කිරීම.
- ස්වභාවික රබර් නිෂ්පාදනය, පරිභෝජනය හා වෙළඳාම සම්බන්ධව අන්තර්ජාතික සංවිධාන සමඟ කටයුතු කිරීම.
- සෙස් අරමුදල් එකතු කිරීම හා පරිපාලනය.
- රබර් වගාවේ හා නිෂ්පාදනයේ ඒ ඒ අවධිවලට අදාළව කුඩා වතු ඉඩම් හිමියන් වෙත අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා දීම.
- කුඩා වතු ඉඩම් හිමියාගේ ආර්ථික උන්නතිය උදෙසා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රබර් අංශයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම හා එක්රැස් කිරීම.
- ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණය කිරීම.


### 1.4.2. ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන්

- රබර් වගාව සඳහා බලපත්‍ර ලබා දීම හා ඉඩම් ලියාපදිංචි කිරීම.
- රබර් නැවත වගාව හා නව වගාව සිදු කිරීම.
- වගාකරුවන් සඳහා වගා සහනාධාර ලබා දීම ඇතුළු අනෙකුත් සේවා ලබා දීම.
- රබර් වෙළඳ හිමියන් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීම.
- රජයේ රබර් පැළ තවාන් පවත්වාගෙන යාම, රබර් පැළ බෙදා හැරීම හා පුද්ගලික පැළ තවාන් අධීක්ෂණය.
- කුඩා වතු හිමියන් හා වතු හිමියන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- රබර් වගාවට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනුවත් කර රෝග පාලනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රබර් වගා හිමියන්ගේ ආර්ථික ශක්තිය නගා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- රබර් වගාව සම්බන්ධ දැනුම හා පුහුණුව ලබා දීම.

### 1.4.3. රබර් පැළ තවාන්වල කාර්යයන්


- රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත නැවත වගාව හා නව වගාව සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් උසස් බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම.
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නව ක්ලෝන සොයා ගැනීම්වලට අනුව වැඩි දියුණු කරන ලද ප්‍රභේද ගොවීන්ට හඳුන්වා දීම.
- අවශ්‍ය අවස්ථාවලදී වැවිලි සමාගම්වල පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.
- රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වගාවන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

## 1.5. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




*ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කරන ලද නිලධාරීන්.

## 1.6. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය



## 1.7. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අනුමත ප්‍රමාණය | දැනට සිටින ප්‍රමාණය | පුරප්පාඩු ප්‍රමාණය | අතිරික්ත ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ. - විශේෂ ශ්‍රේණිය) | 1 | 1 | 0 | 0 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප. සේ. - විශේෂ ශ්‍රේණිය) | 1 | 1 | 0 | 0 |
| 03 | අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ- ප්‍රාදේශීය (ශ්‍රී ලං.ප.සේ. - I ශ්‍රේණිය) | 7 | 6 | 1 | 0 |
| 04 | අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ. - I ශ්‍රේණිය) | 1 | 1 | 0 | 0 |
| 05 | අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) | 1 | 0 | 1 | 0 |
| 06 | ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ. - I ශ්‍රේණිය) | 1 | 1 | 0 | 0 |
| 07 | ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලං.ග. සේ. - I ශ්‍රේණිය ) | 1 | 1 | 0 | 0 |
| 08 | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ. - II , III ශ්‍රේණිය) | 12 | 8 | 4 | 0 |
| 09 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ. - II , III ශ්‍රේණිය) | 1 | 1 | 0 | 0 |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) | 1 | 0 | 1 | 0 |
| 11 | නීති නිලධාරි (දෙපාර්තමේන්තුගත) | 1 | 0 | 1 | 0 |
| 12 | ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ. - II , III ශ්‍රේණිය) | 6 | 5 | 1 | 0 |
| 13 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ. - II ශ්‍රේණිය) | 1 | 0 | 1 | 0 |
| 14 | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ. III ) | 2 | 1 | 1 | 0 |
| 15 | පරිපාලන නිලධාරි (ක.සේ.නි.සේ.- අධිශ්‍රේණිය) | 4 | 3 | 1 | 0 |
| 16 | ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තමේන්තුගත-අධි ශ්‍රේණිය) | 17 | 7 | 10 | 0 |
| 17 | භාෂා පරිවර්තක - සිංහල/දෙමළ (භා. ප. සේ) | 1 | 0 | 1 | 0 |
| 18 | තොරතුරු තාක්ෂණ නිලධාරි (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ.) | 2 | 0 | 2 | 0 |
| 19 | තොරතුරු තාක්ෂණ සහකාර (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ.) | 5 | 2 | 3 | 0 |
| 20 | සංවර්ධන නිලධාරි (සං. නි. සේ.) | 22 | 73 | 0 | 51 |
| 21 | ගොඩනැගිලි නඩත්තු නිලධාරි (දෙපාර්තුමේන්තුගත) | 1 | 1 | 0 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **22** | කළමණාකරණ සේවා නිලධාරි (ක.සේ.නි.සේ.) | 120 | 118 | 2 | 0 |
| **23** | කළමණාකාර සහකාර (ක.ස.) | 7 | 6 | 1 | 0 |
| **24** | රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තුමේන්තුගත) | 170 | 110 | 60 | 0 |
| **25** | රියදුරු (රි.සේ.) | 40 | 21 | 19 | 0 |
| **26** | රියදුරු (දෙපාර්තුමේන්තුගත) | 1 | 0 | 1 | 0 |
| **27** | ලොරි සහයක (දෙපාර්තුමේන්තුගත) | 10 | 09 | 1 | 0 |
| **28** | කාර්යාල සේවක සේවය (කා.සේ.සේ.) | 33 | 29 | 4 | 0 |
| | **එකතුව** | **470** | **405** | **116** | **51** |

වගු අංක I

## 2. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය

රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් රබර් වගාව සඳහා එතෙක් පැවති මූල්‍යමය සහනාධාර ක්‍රමය 2023 වසරේදී ක්‍රියාත්මක නොවුණ අතර, ඒ වෙනුවට කුඩාවතු අංශය සඳහා වගාවට අවශ්‍ය බද්ධ රබර් පැළ සහනාධාර ලෙස ලබා දෙන ලදී. ඊට අමතරව රබර් වගාව සඳහා අවශ්‍ය ව්‍යාප්ති සේවාව දෙපාර්තමේන්තුව මඟින් කුඩාවතු අංශයට මෙන්ම වැවිලි සමාගම් සඳහා ද 2023 වසරේදි අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ රබර් වගාව ව්‍යාප්ත කිරීම තුළින් දේශීය ආර්ථිකය නඟා සිටුවීම අරමුණු කර ගනිමින් 2023 වසර තුළ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. **රබර් නැවත වගා කිරීමේ වැඩසටහන (කුඩාවතු)**
2. **රබර් නව වගාකිරීමේ වැඩසටහන (කුඩාවතු)**
3. **රබර් පැළ නිෂ්පාදනය**
4. **රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන්**

**2023 වසරේදී දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාප්ති සේවා සපයන ලද වැඩසටහන්,**

1. **රබර් නැවත වගා කිරීමේ වැඩසටහන (වැවිලි සමාගම් අංශය)**
2. **වැහි ආවරණ යෙදීම (කුඩාවතු / වැවිලි සමාගම්)**
3. **අතුරුබෝග වගාව**

### 2.1. රබර් නැවත වගාව

රබර් වගාවක් ක්ෂේත්‍රයේ ස්ථාපනය කොට වසර 30ක් පමණ ගතවන විට, එම වගාවේ ඵලදායීතාවය ක්‍රමයෙන් අඩු වී යයි. එවැනි රබර් වගා ඉඩම්වල පවතින පැරණි වගාව ඉවත් කොට අලුත් රබර් පැළ ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීම රබර් නැවත වගාව ලෙස හඳුන්වයි. 2023 වසරේ රබර් නැවත වගාව සඳහා සහනාධාර ලෙස රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ගුණාත්මක තත්ත්වයෙන් උසස් බද්ධ රබර් පැළ ගොවීන් වෙත ලබා දෙන ලදී.

#### 2.1.1. රබර් නැවත වගාව- කුඩාවතු අංශය

2023 වසර සඳහා කුඩාවතු අංශයේ හෙක්. 300ක් වූ රබර් නැවත වගා ඉලක්ක අනුව දෙපාර්තමේන්තුව අත් කර ගෙන ඇති භෞතික ප්‍රගතියට අදාළ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

**කුඩාවතු අංශය විසින් රබර් පැළ සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය -2023**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්.) | ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව | අයදුම්පත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.) | නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | නිකුත් කළ බලපත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.) | බලපත්‍ර ලබා ගත් බලපත්‍රලාභීන් සංඛ්‍යාව | නැවත වගාව සිදු කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව | නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) | නැවත වගාව සඳහා පැළ ලබා දුන් ගොවීන් සංඛ්‍යාව | නැවත වගාව සඳහා නිකුත් කළ පැළ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රත්නපුර | 56 | 96 | 66.01 | 90 | 63.10 | 90 | 53 | 31.12 | 50 | 17,585 |
| කොළඹ | 10 | 24 | 21.69 | 20 | 17.89 | 20 | 14 | 15.81 | 14 | 8,803 |
| කෑගල්ල | 112 | 425 | 263.19 | 379 | 233.35 | 379 | 286 | 164.21 | 271 | 80,731 |
| ගම්පහ | 13 | 38 | 28.65 | 28 | 22.80 | 28 | 19 | 18.47 | 17 | 7,915 |
| කුරුණෑගල | 9 | 39 | 36.46 | 37 | 35.23 | 37 | 28 | 26.87 | 28 | 12,489 |
| මහනුවර | 5 | 34 | 17.34 | 29 | 13.39 | 29 | 16 | 7.99 | 12 | 3,255 |
| මාතලේ | 4 | 3 | 7.68 | 3 | 7.68 | 3 | 2 | 4.80 | 2 | 2,580 |
| කළුතර | 48 | 76 | 61.32 | 68 | 59.26 | 68 | 43 | 31.33 | 43 | 16,788 |
| මොනරාගල | 14 | 15 | 6.54 | 12 | 5.82 | 12 | 8 | 4.21 | 8 | 2,101 |
| ගාල්ල | 11 | 5 | 6.65 | 5 | 6.65 | 5 | 2 | 4.05 | 2 | 2,170 |
| මාතර | 18 | 18 | 30.00 | 18 | 30.00 | 18 | 14 | 15.73 | 14 | 8,513 |
| **එකතුව** | **300** | **773** | **545.53** | **689** | **495.17** | **689** | **485** | **324.59** | **461** | **162,930** |

වගු අංක II

2023 වර්ෂයේ දී කුඩාවතු අංශයේ රබර් වගාකරුවන්, නැවත වගාව සඳහා අයදුම් පත්‍ර 773ක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉන් අයදුම් පත්‍ර 689ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කර ඇත. එම බලපත්‍ර යටතේ බලපත්‍රලාභීන් 485 දෙනෙකු විසින් හෙක්.324.59ක භූමි ප්‍රමාණයක රබර් නැවත වගාව සිදු කර ඇත. 2023 වර්ෂයේ කුඩා වතු අංශයේ රබර් නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 300ක් වශයෙන් පැවතිය ද, එම වසරේ වගාකළ බිම් ප්‍රමාණය හෙක්.324.59ක ඉහළ අගයක් ගැනීම සාධනීය ලක්ෂණයකි.

එසේම, වගාකළ ගොවීන් 485 දෙනෙකුගෙන් 461 දෙනෙකුම දෙපාර්තමේන්තු පැළ සහනාධාරය ලබා ගෙන ඇත. ඔවුන් සඳහා පැළ 162,930 දෙපාර්තමේන්තුව සතු පැළ තවාන් මඟින් ලබා දී ඇත.

### 2.1.2. රබර් නැවත වගාව -වැවිලි අංශය

වැවිලි සමාගම් විසින් 2023 වසරේ දී සිදු කළ රබර් නැවත වගාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

**රබර් නැවත වගාව වැවිලි සමාගම් - 2023**

| වැවිලි සමාගමේ නම | ඉදිරිපත් කළ ඉල්ලුම් පත් සංඛ්‍යාව | බලපත්‍ර නිකුත් කළ ඉඩම් ප්‍රමාණය (හෙක්.) | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|
| පුස්සැල්ලාව වැවිලි සමාගම | 34 | 198.75 | 177.87 |
| අගලවත්ත වැවිලි සමාගම | 55 | 335.08 | 279.70 |
| කහවත්ත වැවිලි සමාගම | 2 | 9.86 | 9.86 |
| බලංගොඩ වැවිලි සමාගම | 6 | 20.48 | 20.48 |
| ලලාන් වැවිලි සමාගම | 25 | 153.73 | 131.50 |
| කෑගල්ල වැවිලි සමාගම | 33 | 187.67 | 102.41 |
| කැලණිවැලි වැවිලි සමාගම | 8 | 41.15 | 36.10 |
| මල්වත්තවැලි වැවිලි සමාගම | 9 | 59.93 | 33.52 |
| ඇල්කඩුව වැවිලි සමාගම | 1 | 10.00 | 4.00 |
| කොටගල වැවිලි සමාගම | 9 | 60.07 | 40.07 |
| නමුණුකුල වැවිලි සමාගම | 6 | 38.10 | 20.07 |
| ඇල්පිටිය වැවිලි සමාගම | 1 | 7.01 | - |
| රාජ්‍ය වැවිලි සංස්ථාව | 1 | 10.01 | - |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 2 | 8.50 | 5.50 |
| **එකතුව** | **192** | **1140.34** | **861.08** |

වගු අංක III

2023 වසරේ වැවිලි සමාගම් 14ක් වෙනුවෙන් රබර් නැවත වගාව සඳහා හෙක්.1,140.34කට බලපත්‍ර නිකුත් කරනු ලැබූ අතර, ඉන් හෙක්.861.08ක නැවත වගාව සිදු කර ඇත.

## 2.2. රබර් නව වගාව

### 2.2.1 රබර් නව වගාව -කුඩාවතු අංශය

රබර් වගාවක් නොපවතින භූමියක අලුතින් රබර් වගාව ආරම්භ කිරීම රබර් නව වගාවක් ලෙස හඳුන්වනු ලබයි. පවතින රබර් ඉඩම් ප්‍රමාණය වැඩි කරමින් රබර් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රබර් නව වගා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. කුඩාවතු හිමියන් සඳහා දෙපාර්තමේන්තුව මඟින් 2023 වසර සඳහා ලබා දුන් නව වගා ඉලක්කය හෙක්.600 කි.

**දෙපාර්තමේන්තු රබර් පැළ සහනාධාර යටතේ රබර් නව වගා කළ බිම් ප්‍රමාණය - 2023 (කුඩාවතු)**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්.) | ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව | අයදුම් පත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.) | නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | නිකුත් කළ බලපත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.) | බලපත්‍ර ලබා ගත් බලපත්‍රලාභීන් සංඛ්‍යාව | නව වගාව සිදු කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව | නව වගාව සිදු කළ බිම් ප්‍රමාණය (හෙක්.) | නව වගාව සඳහා පැළ ලබා දුන් ගොවීන් සංඛ්‍යාව | නව වගාව සඳහා නිකුත් කළ පැළ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රත්නපුර | 14 | 43 | 24.45 | 39 | 21.47 | 39 | 17 | 6.43 | 18* | 3,945 |
| කොළඹ | 5 | 15 | 6.28 | 15 | 5.97 | 15 | 6 | 1.57 | 12* | 1,478 |
| කෑගල්ල | 33 | 146 | 50.42 | 126 | 42.65 | 126 | 94 | 33.36 | 89 | 17,604 |
| ගම්පහ | 5 | 26 | 13.97 | 23 | 10.60 | 23 | 12 | 6.91 | 11 | 2,409 |
| කුරුණෑගල | 3 | 39 | 17.54 | 29 | 14.31 | 29 | 21 | 8.14 | 21 | 4,204 |
| මහනුවර | 2 | 16 | 8.12 | 15 | 7.93 | 15 | 12 | 4.93 | 12 | 2,593 |
| මාතලේ | 3 | 1 | 0.74 | 1 | 0.74 | 1 | 1 | 0.73 | 1 | 392 |
| අනුරාධපුර | 2 | 4 | 1.62 | 4 | 1.42 | 4 | 3 | 1.10 | 3 | 591 |
| කළුතර | 9 | 34 | 13.62 | 28 | 10.77 | 28 | 18 | 7.35 | 18 | 4,209 |
| මොනරාගල | 421 | 873 | 466.38 | 807 | 439.50 | 807 | 534 | 295.31 | 534 | 148,787 |
| බදුල්ල | 42 | 77 | 49.33 | 51 | 28.70 | 51 | 51 | 28.70 | 51 | 14,976 |
| අම්පාර | 42 | 37 | 23.83 | 30 | 17.21 | 30 | 18 | 8.72 | 18 | 4,517 |
| ගාල්ල | 6 | 16 | 13.13 | 16 | 13.13 | 16 | 7 | 4.80 | 7 | 2,705 |
| මාතර | 5 | 11 | 6.76 | 11 | 6.76 | 11 | 6 | 2.13 | 6 | 1,192 |
| හම්බන්තොට | 8 | 28 | 13.50 | 28 | 13.50 | 28 | 17 | 6.69 | 17 | 3,681 |
| **එකතුව** | **600** | **1,366** | **709.69** | **1,223** | **634.66** | **1,223** | **817** | **416.87** | **818** | **213,283** |

වගු අංක IV

*පැළ ලබා දී ඇතත් 2023 වසරේ වගාව සිදු නොකළ ගොවීන් ඇත. ඔවුන්ගේ බලපත්‍ර 2024 වර්ෂය තෙක් දීර්ඝ කර ඇත.

කුඩා වතු අංශයේ රබර් නව වගා ඉලක්කය ළඟා කර ගැනීමේ ප්‍රගතිය 69% කි. නව රබර් වගා හෙක්.416.87 ක් ස්ථාපනයට ගොවීන් 818 දෙනෙකු සඳහා දෙපාර්තමේන්තුව මඟින් බද්ධ රබර් පැළ 213,283ක් සහනාධාර ලෙස ලබා දී ඇත. ඉහත වගුවට අනුව 2023 වසරේ දී මොනරාගල, කෑගල්ල, බදුල්ල යන දිස්ත්‍රික්ක රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව වගා දෙපාර්තමේන්තු ඉලක්කය සම්පූර්ණ කිරීමේදී වැඩි දායකත්වයක් ලබා දී ඇත.

2018 වසර සිට 2023 වසර දක්වා ශ්‍රී ලංකාවේ රබර් නව වගාව සිදු කළ මුළු බිම් ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

**රබර් නව වගා බිම් ප්‍රමාණය 2018– 2023(හෙක්.)**

| වර්ෂය | කුඩා වතු (හෙක්.) | වැවිලි සමාගම් (හෙක්.) | එකතුව (හෙක්.) |
|---|---|---|---|
| 2018 | 981 | 48 | 1,029 |
| 2019 | 1,103 | - | 1,103 |
| 2020 | 726 | 25 | 751 |
| 2021 | 1,186 | 02 | 1,188 |
| 2022 | 489 | 15 | 504 |
| **2023** | **417** | **-** | **417** |

වගු අංක V

## 2.3. රබර් පැළ නිෂ්පාදනය

### 2.3.1. රජයේ පැළ තවාන්

රබර් පර්යේෂණ ආයතනය හා සම්බන්ධ වෙමින් නිරන්තරයෙන් ඔවුන්ගේ පර්යේෂණ මඟින් සොයාගන්නා නව සොයාගැනීම් අනුව ගුණාත්මක රබර් පැළ නිෂ්පාදනය කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති රබර් පැළ තවාන් 08 මඟින් 2023 වසරේ සිදු කරන ලද රබර් පැළ නිෂ්පාදනය හා පැළ බෙදා හැරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**රජයේ පැළ තවාන්හි පැළ නිෂ්පාදනය සහ පැළ බෙදා හැරීම - 2023**

| තවානේ නම | පැළ බෙදාහැරීම් ඉලක්කය | නිෂ්පාදිත පැළ සංඛ්‍යාව | බෙදා හරින ලද පැළ සංඛ්‍යාව |
|---|---|---|---|
| කරපිංච | 40,000 | 48,220 | 44,096 |
| වැලිකඩමුල්ල | 74,000 | 114,934 | 108,859 |
| මීරිගම | 74,000 | 77,931 | 74,445 |
| ඇගල්ඔය | 70,000 | 78,788 | 45,145 |
| ගුරුගොඩ | 50,000 | 73,816 | 40,911 |
| කුඹුක්කන | 222,000 | 180,264 | 193,945 |
| පදියතලාව | 45,000 | 44,457 | 39,024 |
| මිද්දෙනිය | 35,000 | 55,723 | 51,230 |
| **එකතුව** | **610,000** | **674,133** | **597,655** |

වගු අංක VI

පැළ තවාන් මඟින් 2023 වර්ෂයේ පැළ බෙදාහැරීමේ ඉලක්කය 610,000කි. එම ඉලක්කය සපුරාගැනීම සඳහා බද්ධ රබර් පැළ 674,133ක් නිෂ්පාදනය කර ඇති අතර, ඉන් පැළ 597,655ක්

නව වගා හා නැවත වගා සඳහා බෙදා හැරීමට කටයුතු කර ඇත. 2023 වර්ෂයේ රජයේ පැළ තවාන්හි පැළ බෙදා හැරීම අංශ අනුව පහත වගුවේ දක්වා ඇත.

| තවානේ නම | 2023 වසරේදී නිකුත් කරන ලද මුළු පැළ සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | කුඩා වතු | වැවිලි සමාගම් | STaRR ව්‍යාපෘතිය | වෙනත් | එකතුව |
| කරපිංච | 36,243 | 1,800 | - | 6,053 | 44,096 |
| වැලිකඩමුල්ල | 78,854 | 15,100 | 11,605 | 3,300 | 108,859 |
| මීරිගම | 60,640 | 12,305 | - | 1,500 | 74,445 |
| ගුරුගොඩ | 32,960 | 6,220 | - | 1,731 | 40,911 |
| ඇගල්ඔය | 27,688 | 13,975 | - | 3,482 | 45,145 |
| කුඹුක්කන | 154,917 | 8,112 | 27,380 | 3,536 | 193,945 |
| පදියතලාව | 32,240 | - | 5,000 | 1,784 | 39,024 |
| මිද්දෙනිය | 31,517 | 1,550 | 17,348 | 815 | 51,230 |
| **එකතුව** | **455,059** | **59,062** | **61,333** | **22,201** | **597,655** |

. වගු අංක VII

## 2.3.2. පෞද්ගලික පැළ තවාන්

ශ්‍රී ලංකාවේ නැවත වගා හා නව වගා සඳහා වාර්ෂික පැළ අවශ්‍යතාවය මුළුමනින්ම සැපිරීම රජයේ තවාන් මඟින් සිදු නොවේ. පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේදී පෞද්ගලික තවාන් හිමියන් මෙන්ම වැවිලි සමාගම් ද සැළකිය යුතු දායකත්වයක් සපයති. 2023 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව පෞද්ගලික අංශයේ පැළ නිෂ්පාදනය හා බෙදා හැරීම පහත දැක්වේ.

**පැළ නිෂ්පාදනය හා බෙදා හැරීම - 2023 (පෞද්ගලික පැළ තවාන්)**

| දිස්ත්‍රික්කය | පැළ තවාන් සංඛ්‍යාව | 2023 වර්ෂය තුළ පැළ නිෂ්පාදනය කළ පැළ සංඛ්‍යාව | 2023 වර්ෂය තුළ පැළ බෙදා හැරීම කළ පැළ සංඛ්‍යාව |
|---|---|---|---|
| රත්නපුර | 7 | 261,780 | 75,770 |
| කොළඹ | 5 | 104,425 | 36,790 |
| කෑගල්ල | 20 | 383,604 | 171,461 |
| ගම්පහ | 5 | 75,900 | 38,700 |
| මහනුවර | 1 | 7,800 | 2,140 |
| කුරුණෑගල | 1 | 3,500 | 2,012 |
| කළුතර | 6 | 634,140 | 105,879 |
| මොනරාගල | 1 | 39,217 | 28,412 |
| ගාල්ල | 3 | 39,895 | 1,020 |
| **එකතුව** | **49** | **1,550,261** | **462,184** |

වගු අංක VIII

## 2.4. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන

සාම්ප්‍රදායිකව රබර් වගා කරන ප්‍රදේශවල පවතින ප්‍රධානතම ගැටළුවකි, වර්ෂාව නිසා කිරි අස්වනු ලබා ගැනීමට බාධා සිදු වීම. වැසි ආවරණ යෙදීම තුළින් වසර පුරා වරින් වර තෙත් කලාපයට ඇතිවන වර්ෂා කාලයන් තුළ සාර්ථකව රබර් කිරි අස්වැන්න අඛණ්ඩව ලබා ගැනීමට කුඩා රබර් වතු හිමියන්ට මෙන්ම වැවිලි සමාගම්වලට ද හැකියාව ලැබේ. වැසි ආවරණ යෙදීම සඳහා දෙපාර්තමේන්තු මඟපෙන්වීම යටතේ කුඩාවතු අංශය හා වැවිලි සමාගම් අංශය 2023 වසරේදී ළඟා කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

**වැසි ආවරණ යෙදීම - 2023 (කුඩාවතු අංශය)**

| දිස්ත්‍රික්කය | වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.) | වැසි ආවරණ යෙදූ ගස් සංඛ්‍යාව | වැසි ආවරණ යෙදූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| රත්නපුර | 31.11 | 12,981 | 23 |
| කොළඹ | 7.87 | 3,500 | 9 |
| කෑගල්ල | 103.54 | 49,453 | 49 |
| ගම්පහ | 7.40 | 4,171 | 5 |
| කුරුණෑගල | 43.76 | 15,520 | 9 |
| කළුතර | 9.16 | 3,235 | 5 |
| ගාල්ල | 0.40 | 175 | 1 |
| මාතර | 13.64 | 5,582 | 5 |
| **එකතුව** | **216.88** | **94,617** | **106** |

වගු අංක IX

කුඩාවතු අංශයේ වැහි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය හෙක්.216.88ක් වන අතර, පසුගිය වර්ෂය හා සැසඳීමේදී එය හෙක්.600ක පමණ අඩුවීමකි. පෙර වර්ෂවල වැසි ආවරණ යෙදීම සඳහා ක්‍රියාත්මක කරන ලද සහනාධාර ක්‍රමය 2023 වසරේදී ක්‍රියාත්මක නොවීම මේ සඳහා ඍජුවම බලපා ඇත.

වැවිලි සමාගම් විසින් 2023 වසරේ දී රබර් වගාව සඳහා වැසි ආවරණ යෙදීම පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

**වැසි ආවරණ යෙදීම - 2023 (වැවිලි සමාගම)**

| වැවිලි සමාගමේ නම | වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.) | වැසි ආවරණ යෙදූ ගස් ගණන |
|---|---|---|
| පුස්සැල්ලාව වැවිලි සමාගම | 1,886.32 | 656,550 |
| බලංගොඩ වැවිලි සමාගම | 285.60 | 82,329 |
| හපුගස්තැන්න වැවිලි සමාගම | 64.00 | 26,404 |
| අගලවත්ත වැවිලි සමාගම | 1,542.42 | 383,244 |
| කුරුවිට රබර් පර්යේෂණායතනය | 105.58 | 34,911 |
| ලලාන් වැවිලි සමාගම | 2,627.96 | 844,811 |
| කෑගල්ල වැවිලි සමාගම | 1,334.80 | 396,876 |
| හොරණ වැවිලි සමාගම | 240.96 | 88,072 |
| ඇල්පිටිය වැවිලි සමාගම | 375.85 | 130,780 |
| නමුණුකුල වැවිලි සමාගම | 134.26 | 39,229 |
| **එකතුව** | **8,597.75** | **2,683,206** |

වගු අංක X

2023 වසරේ වැවිලි සමාගම් විසින් වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය හෙක්.8,597.75කි.

## 2.5. අතුරු භෝග වගාව

රබර් වගාකරුවන්ට යම් අමතර ආදායමක් ලබා ගැනීම සඳහා **අතුරු භෝග වගා ක්‍රමය** හඳුන්වා දී ඇත. ඒ අනුව, අන්නාසි, කෙසෙල්, වැල් දොඩම්, ගස්ලබු, කොකෝවා, මිරිස්, ඉඟුරු, පුවක්, කුරුඳු, ලූණු, මුං ඇට, කවුපි, උඳු, තල, කුරක්කන්, එනසාල්, සාදික්කා, ගම්මිරිස්, එළවළු වර්ග, බඩඉරිඟු වැනි භෝග අතුරු භෝග ලෙස වගා කළ හැකි ය. රබර් පර්යේෂණායතනයේ නිර්දේශ අනුව සාර්ථකව වගා කරන ලද අතුරු භෝග වගාවක් සැමවිටම වගාකරුවාගේ ආර්ථිකය ශක්තිමත් කරයි. 2023 වසරේ දී දෙපාර්තමේන්තුව මඟින් අතුරු භෝග වගාව සඳහා සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක නොවුණු නමුත්, දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවාව තුළින් ගොවීන් 164 දෙනෙකු හෙක්.100.21ක බිම් ප්‍රමාණයක අතුරු භෝග වගාව සිදු කිරීම සඳහා යොමු කිරීමට හැකි වී ඇත.

**2023 වර්ෂයේ අතුරු බෝග වගාව**

| දිස්ත්‍රික්කය | වගා කළ භෝග වර්ගය | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) | වගා කළ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| රත්නපුර | අන්නාසි | 2.04 | 4 |
| කොළඹ | අන්නාසි | 1.43 | 5 |
| | | **3.47** | **9** |
| කෑගල්ල | අන්නාසි | 26.64 | 44 |
| | කෙසෙල් | 11.48 | 14 |
| | එළවළු | 1.82 | 4 |
| | වෙනත් බෝග | 3.62 | 5 |
| ගම්පහ | අන්නාසි | 13.38 | 17 |
| | වෙනත් බෝග | 1.21 | 1 |
| කුරුණෑගල | කෙසෙල් | 3.88 | 6 |
| | වෙනත් බෝග | 0.80 | 1 |
| මහනුවර | කෙසෙල් | 4.70 | 7 |
| අනුරාධපුර | එළවළු | 0.61 | 3 |
| | ධාන්‍ය | 1.21 | 1 |
| | | **69.35** | **103** |
| කළුතර | අන්නාසි | 4.43 | 7 |
| | කෙසෙල් | 0.57 | 2 |
| | එළවළු | 1.59 | 2 |
| | වැල් දොඩම් | 1.01 | 1 |
| | | **7.60** | **12** |
| මොනරාගල | කන්න බෝග | 3.66 | 7 |
| බදුල්ල | කන්න බෝග | 1.96 | 5 |
| අම්පාර | කන්න බෝග | 3.14 | 6 |
| | | **8.76** | **18** |
| ගාල්ල | කන්න බෝග | 2.53 | 3 |
| මාතර | අන්නාසි | 0.45 | 2 |
| | කෙසෙල් | 0.51 | 2 |
| හම්බන්තොට | කෙසෙල් | 2.39 | 6 |
| | කන්න බෝග | 4.74 | 8 |
| | අන්නාසි | 0.41 | 1 |
| | | **11.03** | **22** |
| **මුළු එකතුව** | | **100.21** | **164** |

වගු අංක XI

## 2.6. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම

### 2.6.1. කිරි කැපුම් ශිල්පී පුහුණුව - සාමාන්‍ය

රබර් කිරි අස්වැන්න නිවැරදිව,ඵලදායිව දීර්ඝකාලීනව ලබා ගැනීමට අවස්ථාව සලසමින් නියමිත තාක්ෂණයට අනුව කිරි කැපීම් සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණු වැඩසටහන් වාර්ෂිකව ක්‍රියාත්මක කරයි. 2023 වසරේ පුහුණු වැඩසටහන් 66ක් පවත්වා පුද්ගලයන් 824 දෙනෙකු පුහුණු කිරීම සිදු කර ඇත.

**කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (සාමාන්‍ය)-2023**

| ප්‍රාදේශීය කාර්යාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහනට සහභාගී වූ සංඛ්‍යාව | වැය කළ මුදල (රු. ) |
|---|---|---|---|
| රත්නපුර | 11 | 145 | 95,548.00 |
| කෑගල්ල | 7 | 140 | 116,403.00 |
| කළුතර | 18 | 237 | 136,959.00 |
| මොනරාගල | 21 | 210 | 252,864.00 |
| ගාල්ල | 9 | 92 | 92,000.00 |
| **එකතුව** | **66** | **824** | **693,774.00** |

වගු අංක XII

### 2.6.2. බද්ධකරුවන් පුහුණු වැඩසටහන

බද්ධ කිරීමේ කාර්යයේ නියුතු පුද්ගලයන් මෙන්ම පැළ බද්ධ කිරීමේ කාර්යය සඳහා යොමු වීමට කැමැත්තක් දක්වන ආධුනිකයින් මෙම පුහුණු වැඩසටහන මඟින් පුහුණු කෙරේ .

**බද්ධකරුවන් පුහුණුව- 2023**

| ප්‍රාදේශීය කාර්යාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහනට සහභාගී වූ සංඛ්‍යාව | වැය කළ මුදල (රු. ) |
|---|---|---|---|
| රත්නපුර | 1 | 55 | 132,080.00 |
| කළුතර | 2 | 36 | 64,050.00 |
| මොනරාගල | 2 | 60 | 83,000.00 |
| ගාල්ල | 1 | 10 | 17,868.00 |
| **එකතුව** | **6** | **161** | **296,998.00** |

වගු අංක XIII

### 2.6.3. කෑගල්ල ප්‍රාදේශිය කාර්යාලය මඟින් කළ පුහුණු වැඩසටහන

| පුහුණු වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුලාභීන් සංඛ්‍යාව | වැය කළ මුදල (රු. ) |
|---|---|---|---|
| මධ්‍ය පරිමාණ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1 | 80 | 151,000.00 |
| RRISL 2001 හා RRISL 203 ක්ලෝන වගා කරන ලද ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2 | 120 | 17,000.00 |

වගු අංක XIV

රබර් වගාව සඳහා පොහොර යෙදීමේ පුහුණු වැඩසටහන, රබර් වගාව සඳහා පොහොර යෙදීමේ පුහුණු වැඩසටහන, රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ පුහුණුව, රබර් ෂීට් නිෂ්පාදන පුහුණුව, රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුව වැනි පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.

## 2.7.ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු- 2023

### 2.7.1. රබර් වගා බිම් ප්‍රමාණය

2010 වසරේ දිවයිනම ආවරණය වන පරිදි සිදු කරන ලද රබර් ඉඩම් සංගණනයේ දත්ත මත පදනම්ව වාර්ෂිකව සිදු කරනු ලබන නව වගා ප්‍රමාණය හා වගාවෙන් ඉවත් වන ඉඩම් ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් 2023 වසරේ ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත රබර් ඉඩම් ප්‍රමාණය ගණනය කර ඇත.

**රබර් ඉඩම් ප්‍රමාණය (2023)**

| වර්ෂය | ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණය (හෙක්.) | | |
|---|---|---|---|
| | කුඩා වතු අංශය | ප්‍රාදේශීය වැවිලි සමාගම්/රාජ්‍ය වතු | එකතුව |
| **2023** | **67,039** | **31,354** | **98,393** |

වගු අංක XV

### 2.7.2. ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් නිෂ්පාදනය - 2023

2023 වසරේ රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 64,444කි. එම අගය 2022 වසර හා සැසඳීමේදී මෙට්‍රික් ටොන් 6,423කින් පහළ යාමකි. 2023 වසරේ අග භාගයේ රබර් මිලෙහි ශීඝ්‍ර ලෙස පහළ යාමත්, වසර පුරා ව්‍යාප්තව පැවති අධික වර්ෂාවත්, පත්‍ර පතන රෝගය වගා භූමි තුළ බහුලව පැවතීමත් නිෂ්පාදනය පහළ යාම සඳහා හේතු වී ඇත.

**ලෝක රබර් නිෂ්පාදනය - 2023 (මෙට්‍රික් ටොන් දහස්)**

| රට | රබර් නිෂ්පාදනය 2022 | රබර් නිෂ්පාදනය 2023 |
|---|---:|---:|
| තායිලන්තය | 4,786 | 4,707 |
| ඉන්දුනීසියාව | 2,717 | 2,651 |
| වියට්නාමය | 1,340 | 1,293 |
| චීනය | 862 | 835 |
| ඉන්දියාව | 843 | 849 |
| මැලේසියාව | 377 | 340 |
| කාම්බෝජය | 382 | 392 |
| මියන්මාරය | 299 | 300 |
| පිලිපීනය | 208 | 191 |
| ශ්‍රී ලංකාව | 71 | 64 |
| බංගලාදේශය | 23 | 23 |
| පැපුවා නිව්ගිනියා | 6 | 6 |
| අනෙකුත් රටවල් | 2,332 | 2,639 |
| **ලෝක නිෂ්පාදනය** | **14,245** | **14,290** |

වගු අංක XVI

*මූලාශ්‍රය- ස්වාභාවික රබර් නිෂ්පාදනය කරන රටවල සංගමයේ (ANRPC) දත්ත ඇසුරෙන්*

ඉහත වගුවට අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේ ලෝක රබර් නිෂ්පාදනය මෙ.ටො.දහස් 45කින් වැඩි වී ඇත. 2022 වර්ෂයේ මෙන්ම 2023 වර්ෂයේදී ද වැඩිම රබර් නිෂ්පාදනයක් සිදු කර ඇත්තේ අග්නිදිග ආසියාතික රටක් වන තායිලන්තය වේ.

### 2.7.3. රබර් නිෂ්පාදන වියදම

**රබර් නිෂ්පාදන වියදම 2021 – 2023** (කි.ග්‍රෑම් 1 ක් /රුපියල්)

| වර්ෂය | වැව්ලි සමාගම් | කුඩා වතු අංශය |
|---|---:|---:|
| **2021** | 364.91 | 221.00 |
| **2022** | 369.43 | 288.00 |
| **2023** | 486.00* | 302.00* |

වගු අංක XVII

*පසුව තොරතුරු යාවත්කාලීන විය හැකිය.

### 2.7.4. ස්වාභාවික රබර් අපනයනය

2022 වර්ෂය සමඟ සසඳන විට 2023 වර්ෂයේදී ලංකාවේ රබර් අපනයනයේ අඩුවීමක් සිදු වී ඇත. එනම්, 2022 වර්ෂයේ ස්වාභාවික රබර් මෙ.ටො. 15,138ක්ව පැවති අපනයනය ප්‍රමාණය 2023 වර්ෂයේ මෙ.ටො. 12,673ක් දක්වා පහළ යාමකි.

### 2.7.5. ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය

ශ්‍රී ලංකාවේ රබර් අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛනවලට අනුව 2023 වසරේදී සමස්ත රබර් අපනයන ආදායම ලෙස රු.මි. 304,770ක් දේශීය ආර්ථිකයට එකතු කිරීමට රබර් අංශයට හැකියාව ලැබී ඇත.

**මුළු රබර් අපනයන ප්‍රමාණය සහ අපනයන ආදායම - 2023**

| වර්ගය | අපනයනය කළ ප්‍රමාණය | අපනයනය ආදායම (රු.මි.) |
|---|---|---|
| ස්වාභාවික රබර් (මෙ.ටො.) | 12,673 | 9,288 |
| කෘත්‍රිම රබර් (මෙ.ටො.) | 57 | 6 |
| අර්ධ නිමි රබර් (මෙ.ටො.) | 9,149 | 935 |
| නිමි භාණ්ඩ (මෙ.ටො.) | 50,516 | 101,120 |
| නිමි භාණ්ඩ (ඒකක) | 23,505,133 | 193,421 |
| සමස්ත රබර් අපනයන ප්‍රමාණය(මෙ.ටො.) | 72,395 | 111,349 |
| සමස්ත රබර් අපනයන ප්‍රමාණය (ඒකක) | 23,505,133 | 193,421 |
| **එකතුව** | | **304,770** |

වගු අංක XVIII

**සමස්ත රබර් අපනයන ආදායම -2023 ( රටවල් අනුව)**

| රට | අපනයන ආදායම (රු. මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඇමෙරිකා එක්සත් ජනපදය | 102,244.9 | 33.5 |
| ජර්මනිය | 27,749.0 | 9.1 |
| බෙල්ජියම | 15,538.8 | 5.1 |
| ඉතාලිය | 14,216.1 | 4.6 |
| බ්‍රසීලය | 11,556.0 | 3.8 |
| කැනඩාව | 10,569.2 | 3.5 |
| ප්‍රංශය | 10,592.5 | 3.5 |
| එක්සත් රාජධානිය | 9,994.2 | 3.3 |
| ඉන්දියාව | 9,220.2 | 3.0 |
| ඕස්ට්‍රේලියාව | 9,137.6 | 3.0 |
| අනෙකුත් රටවල් | 83,951.8 | 27.6 |
| **සමස්ත රබර් අපනයනය ආදායම** | **304,770.3** | **100.00** |

වගු අංක XIX

**ශ්‍රී ලංකාවේ ස්වාභාවික රබර් මිලදී ගත් ප්‍රධාන රටවල් -2023**

| රට | විකුණුම් කළ ප්‍රමාණය (මෙ.ටො.) | ප්‍රතිශතය % |
|---|---:|---:|
| පකිස්තානය | 4,526 | 35.71 |
| ජපානය | 1,040 | 8.21 |
| චීනය | 972 | 7.67 |
| ඉන්දියාව | 907 | 7.16 |
| ජර්මනිය | 696 | 5.49 |
| මැලේසියාව | 664 | 5.24 |
| දකුණු අප්‍රිකාව | 518 | 4.09 |
| වියට්නාමය | 469 | 3.70 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 436 | 3.44 |
| ඉතාලිය | 421 | 3.32 |
| අනෙකුත් රටවල් | 2,024 | 15.97 |
| **එකතුව** | **12,673** | **100** |

වගු අංක XX

## 2.7.6. ස්වාභාවික රබර් ආනයනය

2023 වර්ෂය තුළ ස්වාභාවික රබර් මෙට්‍රික් ටොන් 37,295ක් ආනයනය කර ඇති අතර එම අගය 2022 වර්ෂයේ ආනයනය කළ ප්‍රමාණය මෙ.ටො. 64,459 ක ප්‍රමාණයකට සාපේක්ෂව 42%ක අඩු වීමකි.

**රටවල් අනුව ස්වභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන්-2023**

| රට | ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො.) | ප්‍රතිශතය (%) |
|---|---:|---:|
| තායිලන්තය | 18,233 | 48.89 |
| වියට්නාමය | 9,232 | 24.75 |
| ඉන්දුනීසියාව | 4,924 | 13.2 |
| මැලේසියාව | 1,733 | 4.65 |
| අයිවරි කෝස්ට් | 1,331 | 3.57 |
| ඉන්දියාව | 1,070 | 2.87 |
| බෙල්ජියම | 262 | 0.70 |
| බංගලාදේශය | 218 | 0.58 |
| එක්සත් රාජධානිය | 101 | 0.27 |
| දකුණු අප්‍රිකාව | 70 | 0.19 |
| අනෙකුත් රටවල් | 121 | 0.32 |
| **එකතුව** | **37,295** | **100** |

වගු අංක XXI

## 2.7.7. මුළු රබර් ආනයනය

**මුළු රබර් ආනයන ප්‍රමාණය හා ආනයන වියදම - 2023**

| වර්ගය | ආනයනය කළ ප්‍රමාණය | ආනයන වියදම (රු.මි.) |
|---|---|---|
| ස්වාභාවික රබර් (මෙ.ටො.) | 37,295 | 17,550 |
| කෘත්‍රිම රබර් (මෙ.ටො.) | 52,410 | 29,407 |
| අර්ධ නිමි රබර් (මෙ.ටො.) | 29,123 | 10,504 |
| නිමි භාණ්ඩ (මෙ.ටො.) | 7,710 | 14,757 |
| නිමි භාණ්ඩ (ඒකක) | 2,295,087 | 14,369 |
| සමස්ත රබර් ආනයන ප්‍රමාණය (මෙ.ටො.) | 126,538 | 72,218 |
| සමස්ත රබර් ආනයන ප්‍රමාණය (ඒකක) | 2,295,087 | 14,369 |
| **එකතුව** | | **86,587** |

වගු අංක XXII

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේ ආනයන ප්‍රමාණය මෙන්ම 2023 වසරේ ආනයන වියදමේ සැළකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ. එනම්, 2022 වසරේ පැවති රු.මි.125,863.22 ක ආනයන වියදම 2023 වසරේ දී රු.මි. 86,587ක් දක්වා අඩු වී ඇත.

**සමස්ත රබර් ආනයන වියදම ( රටවල් අනුව)- 2023**

| රට | ආනයන වියදම (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| තායිලන්තය | 12,133 | 14.0 |
| ඉන්දියාව | 11,856 | 13.7 |
| චීනය | 11,554 | 13.3 |
| මැලේසියාව | 7,352 | 8.5 |
| දකුණු කොරියාව | 7,038 | 8.1 |
| ජපානය | 6,635 | 7.7 |
| වියට්නාමය | 4,792 | 5.5 |
| තායිවානය | 4,432 | 5.1 |
| ඉන්දුනීසියාව | 4,028 | 4.7 |
| බ්‍රසීලිය | 3,364 | 3.9 |
| අනෙකුත් රටවල් | 13,403 | 15.5 |
| **එකතුව** | **86,587** | **100** |

වගු අංක XXIII

## 2.7.8. රබර් මිල

### 2.7.8.1. රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍යය

රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍යය

(Farm Gate Price) 2023

| මාසය | ෂීට් රබර් (ආර්.එස්.එස්) | | | | | ලේටෙක්ස් (රබර් කිරි) | ඔට්ටපාලු |
|---|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** | | |
| ජනවාරි | 455.73 | 445.35 | 437.15 | 433.21 | 432.53 | 390.42 | 199.92 |
| පෙබරවාරි | 421.24 | 417.54 | 402.51 | 396.45 | 395.61 | 350.13 | 195.68 |
| මාර්තු | 397.98 | 392.91 | 386.62 | 379.18 | 379.46 | 423.50 | 190.17 |
| අප්‍රේල් | 402.15 | 400.70 | 394.19 | 388.48 | 388.19 | 432.27 | 195.61 |
| මැයි | 439.61 | 436.55 | 427.50 | 422.29 | 421.41 | 447.15 | 222.55 |
| ජූනි | 447.74 | 445.74 | 438.76 | 431.24 | 429.82 | 445.66 | 226.90 |
| ජූලි | 474.21 | 472.09 | 468.15 | 458.41 | 456.49 | 453.87 | 246.73 |
| අගෝස්තු | 500.51 | 493.43 | 490.02 | 480.01 | 478.26 | 470.07 | 247.24 |
| සැප්තැම්බර් | 501.09 | 493.43 | 492.24 | 484.75 | 481.65 | 464.61 | 243.06 |
| ඔක්තෝබර් | 520.93 | 516.78 | 514.13 | 504.12 | 500.57 | 475.81 | 252.20 |
| නොවැම්බර් | 579.42 | 571.24 | 579.62 | 570.78 | 569.81 | 497.41 | 275.39 |
| දෙසැම්බර් | 652.85 | 649.30 | 637.45 | 628.00 | 621.80 | 516.08 | 305.24 |
| සාමාන්‍ය අගය | **482.79** | **477.92** | **472.36** | **464.74** | **462.97** | **447.25** | **233.39** |

වගු අංක XXIV

# කොළඹ රබර් වෙන්දේසියේ රබර් වර්ගවල සාමාන්‍ය මිල මාසිකව - 2023

| මාසය | ෂීට් රබර් (ආර්.එස්.එස්) | | | | | ලේටෙක්ස් ක්‍රේප් | | | | | ස්ක්‍රැප් ක්‍රේප් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 1X | 1 | 2 | 3 | 4 | 1XBR | 2XBR | 3XBR | No.4 | F.B. | SKIM |
| ජනවාරි | 472.67 | 483.00 | 476.50 | 456.50 | 450.00 | 600.00 | 572.00 | 466.20 | 438.60 | 422.00 | 398.00 | 389.00 | 392.25 | 395.33 | 358.00 | 370.40 |
| පෙබරවාරි | 505.00 | 485.00 | ඉ. නැත | 452.00 | 440.00 | 616.67 | 610.00 | 558.75 | 490.00 | 485.50 | 451.67 | 428.00 | 432.00 | 419.33 | 415.00 | 424.33 |
| මාර්තු | 480.00 | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | 400.00 | 378.00 | 373.67 | 362.67 | ඉ. නැත | 365.00 | 355.00 | ඉ. නැත | 374.67 |
| අප්‍රේල් | 464.00 | 446.75 | 444.00 | 426.50 | 417.50 | 572.50 | 570.00 | 517.50 | 481.25 | 463.75 | 440.00 | 417.70 | 440.00 | 429.33 | ඉ. නැත | 440.25 |
| මැයි | 485.00 | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | 640.25 | 639.75 | 613.75 | 586.25 | 515.33 | 485.00 | 475.00 | 471.50 | 456.50 | ඉ. නැත | 456.67 |
| ජූනි | 536.25 | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | 668.25 | 659.50 | 551.25 | 491.67 | 456.25 | 435.75 | ඉ. නැත | 438.67 | 435.00 | 400.00 | 434.31 |
| ජූලි | 600.00 | ඉ. නැත | 550.00 | ඉ. නැත | ඉ. නැත | 732.50 | 731.67 | 602.50 | 513.75 | 474.25 | 456.00 | 454.33 | 444.00 | 434.83 | 427.50 | 438.00 |
| අගෝස්තු | 518.33 | 510.00 | 500.00 | 480.00 | 470.00 | 778.75 | 754.00 | 542.40 | 456.40 | 441.40 | 419.50 | 402.50 | 400.38 | 391.00 | 382.67 | 400.87 |
| සැප්. | 566.00 | ඉ. නැත | 545.00 | ඉ. නැත | ඉ. නැත | 806.00 | 785.00 | 570.00 | 501.75 | 470.25 | 443.00 | 410.00 | 413.25 | 408.75 | ඉ. නැත | 405.50 |
| ඔක්. | 610.00 | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | 845.00 | 811.67 | 539.00 | 512.60 | 498.60 | 479.75 | 465.67 | 456.10 | 440.75 | ඉ. නැත | 439.00 |
| නොවැ. | 682.33 | 650.00 | ඉ. නැත | ඉ. නැත | ඉ. නැත | 851.25 | 835.00 | 553.75 | 540.00 | 536.50 | 518.25 | 512.50 | 496.33 | 472.50 | 485.00 | 474.50 |
| දෙසැම්බර් | 793.33 | 772.50 | ඉ. නැත | 752.00 | ඉ. නැත | 898.00 | 865.00 | 746.25 | 653.75 | 645.00 | 610.00 | 565.00 | 593.33 | 586.00 | ඉ. නැත | 589.00 |
| සාමාන්‍ය | **559.41** | **557.88** | **503.10** | **513.40** | **444.38** | **728.11** | **712.14** | **555.11** | **503.67** | **481.88** | **458.30** | **451.97** | **445.23** | **435.36** | **406.86** | **437.29** |

වගු අංක XXV

## 2.7.9. අන්තර් ජාතික රබර් මිල (2018-2023)

| වර්ෂය | ශ්‍රී ලංකා රුපියල් | | | |
|---|---|---|---|---|
| | කොළඹ වෙන්දේසි මිල(රු.) (RSS 3) | බැංකොක් වෙන්දේසි මිල(රු.) (RSS 3) | කොට්ටායම් වෙන්දේසි මිල(රු.) (RSS 4) | සයිකොම් වෙන්දේසි මිල(රු.) (RSS 3) |
| **2018** | 263.11 | 257.00 | 301.80 | 256.01 |
| **2019** | 272.43 | 296.90 | 343.08 | 297.05 |
| **2020** | 318.86 | 327.01 | 339.82 | 322.17 |
| **2021** | 435.52 | 389.13 | 443.64 | 416.54 |
| **2022** | 556.56 | 619.89 | 676.16 | 585.65 |
| **2023** | **503.10** | **564.71** | **605.20** | **575.34** |

වගු අංක XXVI

## 2.8. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු

2023 වසරේදී රබර් මිලදී ගැනීම සඳහා රබර් වෙළෙඳුන් වෙත බලපත්‍ර නිකුත් කිරීමේ තොරතුරු දිස්ත්‍රික්ක අනුව පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව | එකතුව (2023 වසර තුළ නිකුත් කළ මුළු බලපත්‍ර සංඛ්‍යාව) |
|---|---|---|---|
| රත්නපුර | 118 | 8 | 126 |
| කොළඹ | 39 | 2 | 41 |
| කෑගල්ල | 170 | 7 | 177 |
| ගම්පහ | 25 | 5 | 30 |
| කුරුණෑගල | 8 | - | 8 |
| මහනුවර | 11 | - | 11 |
| මාතලේ | 1 | - | 1 |
| කළුතර | 128 | 6 | 134 |
| මොනරාගල | 34 | 27 | 61 |
| බදුල්ල | 1 | 2 | 3 |
| අම්පාර | 1 | 0 | 1 |
| ගාල්ල | 26 | 0 | 26 |
| මාතර | 24 | 5 | 29 |
| හම්බන්තොට | 1 | 0 | 1 |
| **එකතුව** | **587** | **62** | **649** |

වගු අංක XXVII

## 2.9. ඒකාබද්ධ අරමුදල

| වියදම් විෂය | | වෙන්කළ **ප්‍රතිපාදනය (රු.)** | 2023.12.31 දිනට **ශුද්ධ වියදම (රු.)** |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | |
| වැටුප් හා වේතන | 1001 | 209,698,000.00 | 202,215,936.34 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 1002 | 7,000,000.00 | 3,258,822.66 |
| වෙනත් දීමනා | 1003 | 93,000,000.00 | 88,733,877.70 |
| ගමන් වියදම් - දේශීය | 1101 | 15,000,000.00 | 12,705,413.88 |
| ගමන් වියදම් - විදේශීය | 1102 | - | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1201 | 7,000,000.00 | 6,246,587.05 |
| ඉන්ධන | 1202 | 17,000,000.00 | 13,546,359.09 |
| ආහාරපාන සහ නිල ඇඳුම් | 1203 | 500,000.00 | 486,995.25 |
| වෙනත් සැපයුම් | 1205 | 800,000.00 | 655,869.84 |
| වාහන නඩත්තු | 1301 | 10,000,000.00 | 8,850,398.92 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | 1302 | 1,200,000.00 | 1,115,264.02 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු | 1303 | 850,000.00 | 762,610.00 |
| ප්‍රවාහන | 1401 | 3,500,000.00 | 2,746,198.15 |
| තැපැල් සහ සන්නිවේදන | 1402 | 6,000,000.00 | 5,518,387.53 |
| විදුලිය සහ ජලය | 1403 | 3,150,000.00 | 2,797,764.30 |
| බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු | 1404 | 48,000,000.00 | 46,224,637.88 |
| වෙනත්(පිරිසිදු කිරීම්/ආරක්ෂක සේවා) | 1409 | 11,000,000.00 | 10,558,950.19 |
| සම්මාදම් සහ දායක මුදල් | 1505 | 48,000,000.00 | 4,124,031.01 |
| රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 1506 | 2,000,000.00 | 1,830,006.65 |
| පාඩු හා කපා හැරීම් | 1701 | - | - |
| එකතුව (පුනරාවර්තන වියදම්) | | **483,698,000.00** | **412,378,110.46** |
| **මූලධන වියදම්** | | | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2001 | 5,000,000.00 | 4,922,393.02 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2002 | 1,000,000.00 | 964,735.19 |
| නඩත්තු හා වැඩිදියුණු කිරීම්-වාහන | 2003 | 6,000,000.00 | 5,721,961.10 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 2102 | - | - |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2103 | 1,000,000.00 | 999,135.00 |
| මෘදුකාංග සංවර්ධනය | 2106 | 5,000,000.00 | 2,498,823.00 |
| කාර්ය මණ්ඩල පුහුණු | 2401 | 1,000,000.00 | 859,691.46 |
| සංවර්ධන සහායන් | 2202 | 700,000,000.00 | 655,085,488.14 |
| පර්යේෂණ සහ සංවර්ධන | 2507 | 2,000,000.00 | 1,979,964.05 |
| එකතුව (මූලධන වියදම්) | | **721,000,000.00** | **673,032,190.96** |
| එකතුව (සම්පූර්ණ) | | **1,204,698,000.00** | **1,085,410,301.42** |

වගු අංක XXVIII

## 2.10. සෙස් බදු අය කිරීම.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝගවලට අනුව ශ්‍රී ලංකාව තුළ රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගෙන් එම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වශයෙන් මිල දී ගන්නා ස්වාභාවික රබර් සඳහා මිලදී ගනු ලබන අමු රබර් කි.ග්‍රෑ 1 ක් සඳහා රු. 4/- බැගින් සෙස් බදු අය කරනු ලැබේ. ඒ අනුව, 2023 වසරේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සෙස් බදු අය කිරීම පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

**සෙස් බදු සඳහා ලියාපදිංචි ආයතන විස්තරය - 2023**

2023 වර්ෂය සඳහා ලියාපදිංචි රබර් ආශ්‍රිත නිෂ්පාදන ආයතන සංඛ්‍යාව - 152

සෙස් බදු ගෙවූ ආයතන සංඛ්‍යාව - 61

**දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2023**

| මාසය | දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි) |
|---|---:|
| ජනවාරි | 26.72 |
| පෙබරවාරි | 14.74 |
| මාර්තු | 6.90 |
| අප්‍රේල් | 28.92 |
| මැයි | 11.43 |
| ජුනි | 14.43 |
| ජුලි | 16.73 |
| අගෝස්තු | 23.57 |
| සැප්තැම්බර් | 13.35 |
| ඔක්තෝබර් | 15.96 |
| නොවැම්බර් | 16.28 |
| දෙසැම්බර් | 8.29 |
| **එකතුව** | **197.32** |

වගු අංක XXIX

සෙස් බදු නියෝගවලට අනුව රබර් ආනයනය හා අපනයනය මත ශ්‍රී ලංකා රේගුව මඟින් 2023 වසරේ අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

**අපනයනය හා ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2023**

| **මාසය** | **ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)** | **අපනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)** |
|---|---:|---:|
| ජනවාරි | 394.49 | 5.52 |
| පෙබරවාරි | 353.19 | 8.63 |
| මාර්තු | 428.24 | 7.28 |
| අප්‍රේල් | 232.02 | 4.43 |
| මැයි | 210.11 | 5.29 |
| ජූනි | 208.99 | 3.19 |
| ජූලි | 290.48 | 3.40 |
| අගෝස්තු | 389.49 | 3.57 |
| සැප්තැම්බර් | 351.60 | 4.50 |
| ඔක්තෝබර් | 316.38 | 3.57 |
| නොවැම්බර් | 455.75 | 2.83 |
| දෙසැම්බර් | 423.51 | 3.53 |
| **එකතුව** | **4,054.25** | **55.74** |

වගු අංක XXX

# 3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| අයවැය 2023 | | සටහන | තත්‍ය 2023 රු. | තත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ -1 |
| - | ජාත්‍යන්තර වෙළදාම් මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් ( අ)** | | - | - | |
| | | | | | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 768,236,000 | 722,250,000 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 28,367,574 | 91,214,920 | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 26,169,048 | 23,452,751 | ඒසීඒ -5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **822,772,622** | **836,917,671** | |
| - | මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ) | | **822,772,622** | **836,917,671** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | | | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ) – (ඈ) | | **822,772,622** | **836,917,671** | |
| | | | | | |
| | **අඩු කලා- වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 309,698,000.00 | වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 294,208,637 | 256,706,131 | |
| 124,000,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 112,215,436 | 101,296,992 | ඒසීඒ 2(ii) |
| 50,000,000.00 | සහනාධාර, ප්‍රදාන හා මාරු කිරීම් | 7 | 5,954,037 | 1,848,218 | |
| | පොළී ගෙවීම් | 8 | - | - | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 14,580 | |
| 483,698,000.00 | මුළු පුනරාවර්තන වියදම්(ඊ) | | **412,378,110** | **359,865,921** | |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන වියදම් | | | | |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා | | | | |
| 12,000,000.00 | වැඩිදියුණු කිරීම් | 10 | 11,609,089 | 9,293,066 | |
| 6,000,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 3,497,958 | - | |
| 700,000,000.00 | ප්‍රාග්ධන මාරු කිරීම් | 12 | 655,085,488 | 652,140,101 | ඒසීඒ-2 (ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,000,000.00 | හැකියා වර්ධනය | 14 | 859,692 | 975,776 | |
| 2,000,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 1,979,964 | 4,403,336 | |
| 721,000,000.00 | මුළු මූලධන වියදම් ( උ) | | **673,032,191** | **666,812,279** | |
| | | | | | |
| | තැන්පතු ගෙවීම් | | 33,283,443 | 90,112,941 | ඒසීඒ -4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 29,994,296 | 25,072,400 | ඒසීඒ -5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 63,277,739 | 115,185,341 | |
| | | | | | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 1,148,688,040 | 1,141,863,541 | |
| | | | | | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ) | | (325,915,418) | (304,945,870) | |
| | | | | | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (325,915,418) | (304,945,870) | ඒසීඒ -7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | | | ඒසීඒ -3 |

වගු අංක XXXI

## 3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | | තත්‍ය වියදම (රු.මි.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 483,698,000 | 483,698,000 | 412,378,110.46 | 85.26 |
| ප්‍රාග්ධන | 721,000,000 | 721,000,000 | 673,032,190.96 | 93.35 |

වගු අංක XXXII

## 3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

අදාළ නොවේ.

### 3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහය | - | 181,929,111.60 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | - | 236,889,746.38 | - | - |
| **9153** | ඉඩම් | - | 408,370,800.00 | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | - | 3,545,429.00 | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| **9160** | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| **9180** | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

වගු අංක XXXIII

## 3.5. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඒඑල්/ඊ/ආර්ඩීඩී/02/23/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි [illegible] දින

ගණන්දීමේ නිලධාරී
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරියේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ ඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

හා ක්‍රියාත්මක කරන ලදී. වංචාව දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්හෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ එය දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා විය හැකිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ලෙසින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 3.1 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 03 ත් වර්ෂ 08 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 08 ක් සම්බන්ධයෙන් එකතුව රු.3,106,351 ක් වූ හිඟ හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | වගකීම සඳහා වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.55,000,000 ක ප්‍රතිපාදනවලින්, අතිකාල හා නිවාඩු දින වැටුප්(1002) වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු. 3,741,177 ක් හා සාමාජිකත්ව හා දායක මුදල් වෙනුවෙන් වෙන් කළ (1505) ප්‍රතිපාදනයෙන් රු.43,875,969 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53ක් හා සියයට91 ක් ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෘදුකාංග සංවර්ධනය සඳහා වැය විෂය අංක 293-2-1-2106 යටතේ සළසා තිබුණු රු.5,000,000 ක ප්‍රතිපාදනවලින් සියයට 50 ක් එනම් රු.2,501,177 ක් උපයෝජනය කර නොතිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2022 ජනවාරි 25 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 හි 02 (ආ) ඡේදය | ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 හි 02 (ආ) මගින් දී ඇති උපදෙස් සහිත එවැනි වාහන අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම කඩිනමින් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් දෝෂ පැවතීම හා අනතුරට පත්වීම ආදී හේතූන් මත වසර 07 ට වැඩි කාලයක සිට අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 04 ක් වර්ෂ 09 ක් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 07 ක් සම්බන්ධයෙන් එකතුව රු.2,086,351 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

### 3.2 අනාර්ථික ගනුදෙනු

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ [illegible] ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු රු.66,700,000 ක් වටිනා පර්චස් 75ක ඉඩමක් දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ රු.59,304,347 ක් ගෙවා මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එම ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණු අතර වසර 14 කට වැඩි කාලයක් ගත වුවද එම ඉඩම කිසිදු ඵලදායී කාර්යයක යොදවා නොතිබුණි.

### 3.3 කළමනාකරණ දුර්වලතා

(අ) දිස්ත්‍රික්ක 15 ක වගාකරුවන් 32563 ක් සඳහා රබර් නැවත වගාව සහ නව වගාව වෙනුවෙන් ලබාදුන් වගා සහනාධාර මුදලින් වගාව අතහැර දැමීම නිසා වගාකරුවන් 3,544 කගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.126,306,217 ක් අයවිය යුතුව තිබුණු නමුත් එම මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව යටතේ වූ පැළ තවාන් 8 ක පැළ ප්‍රමාණයන් සියයට 64 ක ප්‍රමාණයක් පමණක් බෙදාහැර තිබුණු අතර තිබූ පැළ ප්‍රමාණයෙන් සියයට 20 ක් වනම් රබර් පැළ 186,578 ක් වර්ෂය තුළ විනාශ වී තිබුණි.

(ඇ) රබර් ඉඩම් සම්බන්ධව 2010/2011 වර්ෂයට පසුව සංගණනයක් සිදුකර නොතිබුණු අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 කාර්යසාධන වාර්තාව අනුව රබර් ඉඩම් ප්‍රමාණය හෙක්. 138526 ක් ලෙස දක්වා ඇතත් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව රබර් ඉඩම් ප්‍රමාණය හෙක්.98,583.56 ලෙස දක්වා තිබුණි.

(ඈ) රබර් වගාවේ පවතින පත්‍ර පතන රෝගය සඳහා 2023 වසර තුළදී ප්‍රාදේශීය කාර්යාල මගින් කාබෙන්ඩසිම් සහ හෙක්සකොනසෝල් දිලීර නාශක දෙක පිළිවෙලින් කිලෝග්‍රෑම් 835 ක් සහ කිලෝග්‍රෑම් 52ක් ලබා දී ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සියයට 60 කට වඩා වැඩි බිම් ප්‍රමාණයක රෝගය ව්‍යාප්තව ඇති බැවින් රෝග මර්දන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. එම දිලීර නාශකවලින් පිළිවෙලින් කිලෝග්‍රෑම් 597 ක් සහ කිලෝග්‍රෑම් 22.87ක් 2024ජනවාරි 31 වන විටද ප්‍රාදේශීය කාර්යාල වල ඉතිරි වී තිබුණි.

(ඉ) වෙනත් දෙපාර්තමේන්තු හා ආයතනයන්වලින් මෙම දෙපාර්තමේන්තුවට ලැබී වසර 08 සිට 12 දක්වා කාලයක් ගත වී තිබුණු දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහන 03ක් හා යතුරුපැදි 16 ක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 470 ක් හා සත්‍ය කාර්ය මණ්ඩලය 405 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 116 ක් හා අතිරික්ත සංවර්ධන නිලධාරී 51 ක් සේවයේ යෙදී සිටියද එම අතිරික්ත කාර්ය මණ්ඩලය ඉවත් කිරීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වලින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 05 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 01 ක් සඳහා 2021 වර්ෂයේ සිට නිලධාරීන් අනුයුක්ත කරවා ගෙන නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියට සෘජුවම දායක වන ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් 9 ක්ද රබර් සංවර්ධන නිලධාරීන් 61 ද පුරප්පාඩුව පවතින අතර 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ රබර් සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු වැඩිවීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය.

ඩී.ඩී. සිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

6

## 3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තථ්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 830,735,087 | 823,196,685 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(අ) | 57,574,111 | 53,748,863 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 0 | 0 |
| මුළු වත්කම් | | 888,309,198 | 876,945,548 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය මඟින් ශුද්ධ වත්කම් | | 55,892,110 | 47,150,993 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 830,735,087 | 823,196,685 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ආ) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,682,001 | 6,597,870 |
| අගිරි ශේෂය | ඒසීඒ-3 | 0 | 0 |
| මුළු වගකීම් | | 888,309,198 | 876,945,548 |

පිටු අංක...01.......සිට ...25...... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති [illegible] ...26....... සිට ...46 ....... [illegible]

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 26/02/2024

Janaka Dharmakeerthi
Secretary
Ministry of Agriculture and Plantation Industries

ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : [illegible]

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ ගණකාධිකාරී (මුදල්)
නම :
දිනය : 2024.02.21

ප්‍රධාන ගණකාධිකාරී
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක. 465,
බත්තරමුල්ල.

2

## 3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | 2023<br>රු. | 2022<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු ,අධිභාර, දඩ මුදල් හා බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 326,780,008 | 327,922,242 |
| අග්‍රිම ලැබීම් | 768,236,000 | 722,250,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 24,986,771 | 22,954,509 |
| තැන්පතු ලැබීම | 28,367,574 | 91,214,920 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (අ) | **1,148,370,353** | **1,164,341,671** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැයකිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 405,152,103 | 357,998,048 |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | 5,954,038 | 1,848,218 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 980,793 | 22,715,386 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 29,994,296 | 24,854,799 |
| තැන්පතු ගෙවීම් | 33,283,443 | 90,112,941 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් ( ආ) | **475,364,673** | **497,529,392** |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)-(ආ) | 673,005,680 | 666,812,279 |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | | |
| ලාභාංශ | - | - |

| | | |
|---|---|---|
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන් (ඇ) | - | - |
| | | |
| අඩුකළා - මුදල් වැයකිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 673,005,680 | 666,812,279 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය ( ඉ) | 673,005,680 | 666,812,279 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහයන්(ඊ)=(ඇ)-(ඉ) | (673,005,680) | (666,812,279) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය ( උ)=(ඇ)+(ඊ) | **0** | **0** |
| | | |
| <u>මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන් (ඌ) | - | - |
| | | |
| <u>අඩුකළා - මුදල් වැයකිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මුල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| | | |
| මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වු මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

වගු අංක XXXIV

# 4. කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | ඉලක්කය | ප්‍රගතිය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම |
|---|---|---|---|
| **1.** නැවත වගා කළ බිම් ප්‍රමාණය -කුඩාවතු (හෙක්.) | 300 | 324.59 | 108% |
| **2.** නැවත වගා කළ බිම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.) | - | 861.08 | - |
| **3.** නව වගා කළ බිම් ප්‍රමාණය -කුඩාවතු (හෙක්.) | 600 | 416.87 | 69% |
| **4.** රබර් පැළ බෙදා හැරීම් - දෙපාර්තමේන්තු පැළ තවාන් මඟින් (පැළ) | 610,000 | 597,655 | 98% |
| **5.** වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - කුඩා වතු (හෙක්.) | - | 216.88 | - |
| **6.** වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.) | - | 8,597.75 | - |
| **7.**අතුරු බෝග වගාව (හෙක්.) | - | 100.21 | - |
| **8.** රබර් කිරි කැපීම සාමාන්‍ය පුහුණුව ලැබූ සංඛ්‍යාව - (පුද්ගලයන්) | 810 | 824 | 102% |
| **9.** බද්ධ කිරීමේ පුහුණුව ලැබූ සංඛ්‍යාව (පුද්ගලයන්) | 105 | 161 | 153% |

වගු අංක XXXV

රබර් වගා කිරීම සඳහා පැවති සාමාන්‍ය සහනාධාර ක්‍රමය 2023 වසර තුළදී ක්‍රියාත්මක නොවුණ බැවින්, නැවත වගාව (වැවිලි සමාගම්), වැහි ආවරණ යෙදීම (වැවිලි සමාගම්), වැහි ආවරණ යෙදීම (කුඩා වතු) සහ අතුරු බෝග වගාව යන ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරි සැලැස්ම යටතේ ඉලක්ක ලබා දීමක් සිදු නොවුණි.

# 5. තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය

## 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්කය | ප්‍රගතිය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| **2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.** | 1. නව වගාව - කුඩා වතු සඳහා හෙක්. 600 | 416.87 | හෙක්. | 69% |
| | 2. නැවත වගාව - කුඩා වතු සඳහා හෙක්. 300 | 324.59 | හෙක්. | 108% |
| | 3. රජයේ පැළ තවාන්වල බද්ධ රබර් පැළ බෙදාහැරීම - පැළ 610,000 ක් බෙදාහැරීම | 597,655 | පැළ | 98% |
| **2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදනය හා සැපයුම් දාමයන්හි සිදු වන්නා වූ අපතේ යාම අවම කිරීම.** | 1. වැහි ආවරණ යෙදීම - කුඩා වතු* | 216.88 | හෙක්. | |
| | 2. වැහි ආවරණ යෙදීම - වැවිලි සමාගම්* | 8,597.75 | හෙක්. | |

වගු අංක XXXVI

*සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක නොවුණු බැවින් ඉලක්ක ලබා දී නොමැත.

## 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2023 වර්ෂයේ දී රබර් නව වගාව සහ නැවත වගාව මගින් හෙක්ටයාර 1,603ක් වගා කරමින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට දායකත්වය ලබා දී ඇත. එමගින් ජීවී ප්‍රජාවට සංවේදී පරිසර කලාප නිර්මාණය කිරීමට වැදගත් දායකත්වයක් සපයා ඇත. ආර්ථික අර්බුදය හමුවේ ලංකාව තුළ ඇති වූ ආර්ථික පසුබෑම හේතුවෙන් 2023 වසරේදී අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම අසීරු වුවද නැවත වගාව අංශය ඉහළ ප්‍රගතියක් ලබා තිබේ. එහිදී වැවිලි සමාගම් අංශය විසින් ඉහළ දායකත්වයක් සපයා ඇත. එසේම 2023 වසරේදීත් රබර් වගාව ආශ්‍රිතව ඇති වන රෝග හඳුනා ගැනීම, ඒවාට ප්‍රතිකාර හඳුන්වා දීම, රසායනික ද්‍රව්‍ය හා පොහොර සැපයීම ආදි කාර්යය කෙරෙහි තවදුරටත් දෙපාර්තමේන්තු සහය ලබා දී ඇත.

# 6. මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 37 | 27 | 10 |
| **තෘතියික** | 21 | 12 | 9 |
| **ද්විතියික** | 328 | 307 | 21 |
| **ප්‍රාථමික** | 84 | 59 | 25 |
| **කොන්ත්‍රාත්/ අනියම්** | - | - | - |
| | **470** | **405** | **65** |

වගු අංක XXXVII

*දැනට පවතින සේවක සංඛ්‍යාව තුළ අතිරික්ත සංවර්ධන නිලධාරින් 51 දෙනෙකු ඇතුළත් අතර සත්‍ය ඇබෑර්තු ගණන 116 (65+51) කි.

## 6.2. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රුපියල්) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/වි දේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| **පශ්චාත් උපාධි පාඨමාලාව** | 1 | අවු.1 | 98,500.00 | - | දේශීය | කෘෂි ව්‍යවසාය හා තාක්ෂණික කළමණාකරණය පිළිබඳ |
| **පශ්චාත් උපාධි පාඨමාලාව** | 1 | අවු.1 | 173,500.00 | - | දේශීය | රාජ්‍ය පරිපාලන හා කළමණාකරණය පිළිබඳ |
| **ස්වභාවික රබර් නිෂ්පාදනය හා කළමණාකරණ සම්මන්ත්‍රණ පාඨමාලාව(චීනය) - විදේශ පුහුණු දිමනා** | 2 | දින 19 | - | 249,501.08 | විදේශීය | ස්වභාවික රබර් තාක්ෂණය පිළිබඳ |

වගු අංක XXXVIII

## 6.3. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2023.12.31 දිනට

| තවානේ නම | සේවක සංඛ්‍යාව (කොන්ත්‍රාත් පදනම) |
|---|---|
| වැලිකඩමුල්ල තවාන | 44 |
| මීරිගම තවාන | 34 |
| ඇගල්ඔය තවාන | 34 |
| ගුරුගොඩ තවාන | 28 |
| කරපිංච තවාන | 18 |
| කුඹුක්කන තවාන | 55 |
| පදියතලාව තවාන | 32 |
| මිද්දෙනිය තවාන | 16 |
| **එකතුව** | **261** |

වගු අංක XXXIX

## 6.4. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය

පුහුණු වැඩසටහන් සඳහා නිලධාරින් සහභාගී කිරීමෙන් ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම තුළින් ඔවුන් කාර්යාක්ෂමව හා ඵලදායිව සේවය කිරීම නිසා ආයතනයේ කාර්ය සාධනය වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත. පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

| වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---:|---:|
| පෞද්ගලික ලිපිගොනු කළමණාකරණය | 2 | 36,000.00 |
| විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම - මොනරාගල | 1 | 5,000.00 |
| විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂාව හා දැනුම ලබා දීම - මොනරාගල | 30 | 46,080.98 |
| CIGAS පුහුණු වැඩසටහන - ගාල්ල | 1 | 19,000.00 |
| කාර්යාල කළමණාකරණය හා ආයතනික පටිපාටි - ගාල්ල | 37 | 149,909.40 |
| ITMIS පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ පුහුණුව | 9 | 54,000.00 |
| RIMS වැඩසටහන සඳහා කාර්ය මණ්ඩල පුහුණුව | 35 | 23,200.00 |

වගු අංක XL

## 6.5. 2023 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය

| වැඩ විෂය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය % | වියදම (රු.මි.) |
|---|---|---|---|
| නිවිතිගල *ර.සං.නි. කාර්යාල අලුත්වැඩියාව | 0.200 | 100% | 0.216 |
| මාණ්ඩලික නිලධාරි නිල නිවාස අලුත්වැඩියාව(අංක 03නව නගරය රත්නපුර) | 0.075 | අලුත්වැඩියාව සිදු කිරීම අවලංගු කරන ලදී. | |
| පැරඩයිස් අංක 02 *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | 0.065 | 100% | 0.057 |
| මාණ්ඩලික නිලධාරි නිල නිවාස අලුත්වැඩියාව (අංක 03නව නගරය රත්නපුර) | 0.060 | 100% | 0.060 |
| කළුතර ප්‍රාදේශීය කාර්යාලය අලුත්වැඩියාව | 1.000 | 100% | 0.957 |
| ඇගල්ඔය *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | 0.100 | 100% | 0.081 |
| දොඩන්ගොඩ *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | 0.100 | 100% | 0.099 |
| ගුරුගොඩ තවාන් කළමනාකරු නිල නිවාස අලුත්වැඩියාව | 0.150 | 100% | 0.133 |
| ගුරුගොඩ තවාන් අපවහන පද්ධතිය අලුත්වැඩියාව | 0.200 | 100% | 0.138 |
| කොටියාකුඹුර *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | 2.000 | 100% | 2.000 |
| මීරිගම තවාන් කාර්යාලය හා සේවක විවේකාගාරය අලුත්වැඩියාව | 0.300 | 100% | 0.264 |
| මිද්දෙනිය තවාන් කාර්යාලය හා සේවක විවේකාගාරය අලුත්වැඩියාව | 0.500 | 100% | 0.492 |
| මොනරාගල ප්‍රාදේශීය කාර්යාලයේ අභ්‍යන්තර විදුලි පද්ධතිය අලුත්වැඩියාව | 0.100 | 100% | 0.114 |
| **හදිසි අලුත්වැඩියා** | 0.150 | | |
| ඉංගිරිය *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | | 100% | 0.077 |
| මිල්ලෑව *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | | 100% | 0.027 |
| කළුතර ප්‍රාදේශීය කාර්යාල වහල අලුත්වැඩියාව | | 100% | 0.155 |
| උස්සාපිටිය -කෑගල්ල *ර.සං.නි. නිල නිවාස අලුත්වැඩියාව | | 100% | 0.054 |

වගු අංක XLI

* ර.සං.නි. - රබර් සංවර්ධන නිලධාරි

# 7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.6 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.3 | සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.6 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 4.7 | කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම. | අනුකූල වේ. | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA /1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂය නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | නිරවුල් නොවූ ණය ශේෂ 02ක් අය කර ගැනීමට පවතී. නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | අනාගතයේදී වළක්වා ගැනීමට නිලධාරීන් සේවය හැර යන හෝ වැඩ තහනම් වන අවස්ථාවේදීම වහාම ණය ශේෂ අයකර ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත. |
| **13** | **පොදු තැම්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රාකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |

වගු අංක XLII